පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 11 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- චිත්‍ර කලාව I ,

පාසලේ නම : ........................................................................................

ඇතුළත්වීමේ අංකය : ..................................

**කාලය පැය 01 යි.**

❖ සියලු ම ප්‍රශ්නවලට **මෙම පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරු කරගෙන අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



1. රමණීය භූමියක පිහිටි ගල් තලාවක් මත හතරවන බුවනෙකබාහු රජ සමයේ ඉදිකරන ලද ........................................................ විහාරය මෙම රූපයෙන් දැක්වේ.
2. ගඩොල් සහ හුණු බදාම යොදාගෙන ඉදිකරවන ලද මෙය අතීතයේ මහල් .............................................. කින් සමන්විත විය.
3. මෙම අලංකාර ගෘහ නිර්මාණය දකුණු ඉන්දීය ශිල්පියෙක්වන ........................................................ විසින් නිර්මාණය කර ඇත.
4. මෙහි විශිෂ්ට සිතුවම් රැසක් දක්නට ලැබෙන අතර ඒවා ..................................................... යුගයේ සිතුවම්වලට නෑකම් කියයි.
5. මෙම පිළිමගෙහි වැඩ සිටින බුද්ධ ප්‍රතිමාවේ චීවරයේ රැළි .......................................................................... අයුරින් දක්වා ඇත.

- අංක **6** සිට **10** තෙක් දී ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

6. ලාක්ෂා කර්මාන්තය වර්තමානයේ ක්‍රියාකාරී ව පවත්වාගෙන යන ප්‍රදේශය කුමක් ද?.......................................................................
7. අජන්තා ලෙන් අතර අංක එක ලෙනෙහි ඇති විශිෂ්ට සිතුවම කුමන නමකින් හැඳින්වේ ද? ......................................................
8. කාන්තාර රූප පහකින් කළයක හැඩයට සම්පිණ්ඩනය කර ඇති සැරසිල්ලේ නම කුමක් ද? ........................................................
9. වියළි බදාමය මත මැලියම් සමග වර්ණ මිශ්‍ර කර ගනිමින් ඇඳීමේ ශිල්ප ක්‍රමය හඳුන්වන නම කුමක් ද? .................................
10. එම්. සාර්ලිස් ශිල්පියාගේ බෞද්ධ සිතුවම් ජර්මනියේ දී පිටපත් කළේ කුමන මුද්‍රණ ක්‍රමයකින් ද? ...............................................

- අංක **11** සිට **15** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට **යටින් ඉරක් අඳින්න.**

11. අශෝක අධිරාජයා විසින් ඉදිකළ යැයි සැලකෙන සාංචි ස්තූපයේ,

    (1) ඉහළ සිට පහළට කුඩාවනසේ සාදන ඡත්‍ර තුනක් තිබේ.
    (2) සතර දිසාවේ වාහල්කඩ හතරක් ඉදිකර ඇත.
    (3) සාතවාහන යුගයට අයත් තොරණ් දක්නට ලැබේ.
    (4) හර්මිකාව නමින් හඳුන්වන ප්‍රදක්ෂිණා පතයකින් යුක්තවේ.

12. වෛතීසවරම් සිවසුබ්‍රමනියම් ශිල්පියාගේ නිර්මාණයක් වන්නේ,

    (1) "පට්ටුත්තිරත්තාලේ"නම් පොත් පිටකවරයයි.
    (2) හතරවන ශ්‍රේණියේ සිංහල බස පොත් පිටකවරයයි.
    (3) කාලිදාස විසින් රචිත "සකුන්තලා" කාව්‍යයේ පිටකවරයයි..
    (4) "තාණ්ඩවම්" නම් විශිෂ්ට සිතුවමයි.

13. රෆායල් සන්සියෝ ශිල්පියාගේ "ඇතැන්ස් ගුරුකුලය" නම් සිතුවමෙන් නිරූපණය වන්නේ,

    (1) මරියතුමිය හා ජේසු බිළිදායි.
    (2) ශාන්ත ජෝන් බැප්ටිස් ළදරුවායි.
    (3) දේවදූතයින් සමඟ සිටින දෙවියන් වහන්සේයි.
    (4) වාද විවාදවල යෙදි සිටින දාර්ශනිකයින් පිරිසකි.

14. අනුරාධපුර යුගයට අයත් "පන්කුලිය" බුදු පිළිමයේ,

    (1) ඉන්දියාවේ අමරාවති කලා සම්ප්‍රදායේ ලක්ෂණ දක්වේ.
    (2) දකුණතින් විතර්ක මුද්‍රව නිරූපණය වේ.
    (3) චීවරයේ අලංකාර රැළි රටාවන් දක්වා ඇත.
    (4) ත්‍රිභංග ඉරියව්වෙන් වැඩ සිටී.

15. ලක්දිව ගෘහ නිර්මාණ ශිල්පයේ සුවිශේෂ නිර්මාණයක්වන "නිශ්ශංකලතා මණ්ඩපය",

    (1) ක්‍රි. ව. දහවන සියවසට අයත්වේ.
    (2) ඍජු බවෙන් යුතු කුලුනුවල උස අඩි හතකි.
    (3) ආගමික කටයුතු සඳහා ඉදිකරන ලද්දකි.
    (4) කුලුනු ශීර්ෂයේ නෙළුම් කොළයක කැටයමක් ඇත.

- අංක **16** සිට **20** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ **සම්පූර්ණ** වාක්‍යය බැගින් ලියන්න.

16. ඇල්ටමීරා - :..........................................................................................................

..........................................................................................................

17. තාණ්ඩව :..........................................................................................................

..........................................................................................................

18. අඛණ්ඩ කථන ක්‍රමය :..........................................................................................................

..........................................................................................................

19. පද්ම නිධි :..........................................................................................................

..........................................................................................................

20. සටාකාර :..........................................................................................................

..........................................................................................................

- අංක **21** සිට **25** තෙක් දී ඇති රූප සටහන් කොටස් වලට සමීප සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියේ ඇති A,B,C,D,E යන ඒවා අතුරෙන් තෝරා එහි අක්ෂරය **තිත් ඉරි මත** ලියන්න.

21.  (,..............)  A

22.  (,..............)  B

23.  (,..............)  C

24.  (,..............)  D

25.  (,..............)  E

- අංක **26** සිට **30** තෙක් දී ඇති වැකිවල හිස්තැනට වඩාත් සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.

26. ශ්‍රී ලංකාවේ පහතරට කලා ලක්ෂණ සහිත බිතුසිතුවම් දකුණු පළාතේ ......................................... විහාරයේ දක්නට ලැබේ.

27. සාරනාත් බුද්ධ ප්‍රතිමාවේ ප්‍රභා මණ්ඩලය දෙපස ........................................................................... රූප දෙකක් නෙළා ඇත.

28. තිස්ස රණසිංහ ශිල්පියාගේ නිර්මාණයක්වන කොළඹ රාජකීය විද්‍යාලයේ නව රඟහලේ ඇති උන්නත නිර්මාණය ........................................................................... මාධ්‍ය භාවිතයෙන් නිමකර ඇත.

29. හින්දු කෝවිල් ආශ්‍රිත උත්සවවල දී ................................................................. වෙනුවෙන් නිර්මාණය කළ වාහන දැකිය හැක.

30. පොළොන්නරුවේ චිත්‍ර කලාව පිළිබඳ විශිෂ්ට සාධක රැසක් ................................................ ගෙයින් සොයා ගැනීමට හැකිවේ.

- අංක **31** සිට **35** තෙක් දී ඇති ප්‍රශ්නවලට F,G,H,I,J යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



F



G



H



I



J

31. F අක්ෂරයෙන් දැක්වෙන "ජෙෆ්රි යූනුස්" ශිල්පියා විසින් අඳින ලද කාටූන් චරිතයේ නම කුමක් ද? ........................................

32. G අක්ෂරයෙන් දැක්වෙන ග්‍රීක මූර්ති කලාවේ අග්‍රගන්‍ය නිර්මාණය කුමන යුගයකට අයත්වේ ද? ............................................

33. H අක්ෂරයෙන් දැක්වෙන  කොළඹ ජාතික කලාභවනේ ප්‍රදර්ශනයවන සිතුවම නිර්මාණය කළ ශිල්පියාගේ නම

    කුමක් ද?............................................................

34. I අක්ෂරයෙන් දැක්වෙන කවන්ධ මිනිස් රුව කුමන මාධ්‍යකින් නිමවා තිබේ ද ? ..........................................................................

35. J අක්ෂරයෙන් දැක්වෙන ලෝකඩ මාධ්‍යය භාවිතයෙන් නිමවා ඇති ප්‍රතිමාව නිර්මාණය කළ ශිල්ප ක්‍රමය හඳුන්වන

    නම කුමක් ද?...................................................................................

- මෙහි දැක්වෙන නිර්මාණය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළ ව අර්ථවත් සම්පූර්ණ වාක්‍යය **පහක්** ලියන්න. (තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු **නොලැබීමට** හේතුවක් වනු ඇත.)



36. ශිල්පියා පිළිබඳව ඃ..............................................................................................................................
    ...............................................................................................................................

37. තේමාව පිළිබඳව ඃ,.............................................................................................................................
    ..............................................................................................................................

38. වර්ණ භාවිතය පිළිබඳව ඃ.......................................................................................................................
    ............................................................................... ..................................................

39. සංරචනය කර ඇති අයුරු ඃ.....................................................................................................................
    ....................................................................................................................

40. ප්‍රකාශිත හැඟීම් ඃ.........................................................................................................................
    ...........................................................................................................................

( ලකුණු 40)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 11 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- චිත්‍ර - II,

පාසලේ නම : ..........................................

ඇතුළත්වීමේ අංකය : ..........................

**කාලය පැය 02යි**

සැලකිය යුතුයි.

- ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට ද්‍රව මාධ්‍ය භාවිතා කරන සිතුවම් වියළී තිබිය යුතුය. තෙත චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
- දියසායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.
- ද්‍රව්‍ය සමූහය 73cm පමණ උස පැතැලි ඩෙස්ක් එකක් මත තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත.

---

## ❖ නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය.

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති A 4 ප්‍රමාණයේ සුදු කඩදාසිය භාවිතා කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ චිත්‍ර කඩදාසිය භාවිතා කරන්න.

- **ඉහත 1 සහ 2 චිත්‍ර දෙක ම එකට අමුණා ශාලාධිපතිට භාර දෙන්න.**
- ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

### ❖ නිදහස් රේඛා අධ්‍යයනය

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව රේඛා අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා (ලකුණු 05)

### ❖ වර්ණ චිත්‍රය

2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය කිරීම. (ලකුණු 05)
3. පරිමාණ, පර්යාවලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය. (ලකුණු 05)
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම. (ලකුණු 05)
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා (ලකුණු 05)
6. උචිත වර්ණවත් පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව (ලකුණු 05)

සැලකිය යුතුයි

- ද්‍රව්‍ය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 11 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- චිත්‍ර - III,

පාසලේ නම : ..............................................

ඇතුළත්වීමේ අංකය : ..............................

**කාලය පැය 02**

❖ **සැලකිය යුතුයි :**

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ නම ඇතුළත්වීමේ අංකය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ වම්පස ඉහළින් පැහැදිලි ව ලියන්න.
- දියසායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිතා කළහැකිය.

---

❖ **"අ" කොටස "ආ" කොටස හෝ "ඉ" කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරා ගන්න.**

**"අ" කොටස - චිත්‍ර සංරචනය.**

01. ගවයන් ලවා කොළ මඩින (ගොයම් පාගන) අවස්ථාවක්.

02. වැවක දිය නාන පිරිසක්.

03. බක්මහ උළෙලක සිත් ගත් අවස්ථාවක්.

04. පෙරහැරක ගමන් කරන නර්තන කණ්ඩායමක්.

**"ආ" කොටස - මෝස්තර නිර්මාණ.**

5. උස් අතට විහිදී යන සැරසිලි ඇසුරෙන් දොර රෙද්දකට උචිත අලංකාර මෝස්තරයක් නිර්මාණය කරන්න.

6. චීත්ත මුද්‍රණය සඳහා යොදා ගැනීමට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක අඟල් 9 x 9 ප්‍රමාණයේ කොටසක් නිර්මාණාත්මක මල් හා කොළ, ඇසුරෙන් නිර්මාණය කරන්න. ව්‍යාප්ත වන ආකාරය පිළිබඳ ව සැලකිලිමත් වන්න.

7. සාම්ප්‍රදායික සත්ත්ව හැඩතලයක් ඇසුරෙන් බතික් ක්‍රමයට වර්ණ ගැන් වූ බිත්ති සැරසිල්ලක් නිර්මාණය කරන්න.

**"ඉ" කොටස - ග්‍රැපික් චිත්‍ර.**

8. ''ජනකවි '' නමින් පළ කෙරෙන පොතකට සුදුසු පිටකවරයක් නිර්මාණය කරන්න. .

9. බෝතල් අසුරනයක ඇති දේශීය ආහාර වර්ගයක් සඳහා සුදුසු ලේබලයක් නිර්මාණය කරන්න.

10. ''රට නැගුමට තරුණ සවිය'' යන මැයෙන් හරවත් පෝස්ටර් සිතුවමක් නිර්මාණය කරන්න.

(ලකුණු 30)

තෙවන වාර පරීක්ෂණය 2023
11 ශ්‍රේණිය - චිත්‍ර කලාව I
පිළිතුරු පත්‍රය

01. ලංකාතිලක
02. හතරකින්
03. ස්ථපතිරායර්
04. මහනුවර
05. තරංගාකාර
06. මාතලේ හපුවිද
07. පද්මපානි බෝධිසත්ව රුව
08. පංචනාරි ඝටය
09. ටෙම්පරා
10. ලිතෝ මුද්‍රිත
11. (3)
12. (1)
13. (4)
14. (2)
15. (3)

- **(අංක 16 සිට 20 දක්වා දී ඇති වචනයේ අර්ථය පැහැදිලි වනසේ පිළිතුරු ලියා ඇති නම් ලකුණු ලබා දෙන්න.)**

16. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික චිත්‍ර ඇති ස්ථානයකි./ඇල්ටමීරා ගුහාව ස්පාඤ්ඤයට අයත්වේ.
17. නටරාජ ප්‍රතිමාවේ දක්වෙන ශිව දෙවියන්ගේ හෙවත් ඊශ්වර දෙවියන්ගේ නර්තන විලාසය වේ.
18. මහනුවර යුගයේ සිතුවම්වල ඇති ලක්ෂණයකි. /නොකඩවා කතාවක් අනු පිළිවෙලට දැක්වීම
19. අභයගිරිය දාගැබේ පිවිසුම් දොරටුවේ ඇති මුරගලකි.
20. කළයක් මුනින් අතට නැමු හැඩයකි./ස්තූපවල ගර්භය නිර්මාණයේ දී භාවිතයට ගෙන ඇති හැඩයකි.
21. D
22. A
23. B
24. E
25. C
26. කතළුව
27. දේවතා
28. ටෙරාකොටා
29. දෙවිවරුන්
30. තිවංක පිළිම
31. අප්පුහාමි
32. හෙලනිස්තික් යුගය
33. A.C.G.S. අමරසේකර
34. රතු පැහැති හුණු ගලින්
35. වාත්තු කිරීම
36. පැබ්ලෝ පිකාසෝ විසින් අඳින ලද සිතුවමකි.
37. මෙම සිතුවම ගුවර්නිකා ලෙස හැඳින්වේ /ගුවර්නිකා නගරයට බෝම්බ හෙළීම නිරූපනය වේ.
38. සීමිත වර්ණ මාලාවක් භාවිතා කිරීම./අළු, සුදු, කළු පැහැති වර්ණ පමණක් භාවිතා කරමින් ඒකවාර්ණිකත්වයක් දක්නට ලැබීම,/තෙල් සායම් මාධ්‍යයෙන් වර්ණ කර තිබීම.
39. සත්ත්ව හා මානව රූප සුන්බුන් වූ කොටස් ලෙස සම්පිණ්ඩනය කිරීම./ මෙහි ඇති රූප ඝනිකවාදි හැඩයන්ගෙන් යුක්ත වේ.
40. යුද්ධයක දී ඇති වන බිහිසුණු හැඟීම් වන දුක, ශෝකය, වැළපීම, මොරදීම, මළවුන් වැළඳ ගැනීම ආදි හැඟීම් රාශියක් ප්‍රකාශිත සිතුවමකි.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න